අයගම ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 828,667 ක් ලෙස හඳුනාගෙන තිබියදී රු. 500,000 ක් වූ අයවැයගත ආදායම උසාවි දඩ ආදායම ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ එම ආදායම රු. 328,667 ක් අඩුවෙන් දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 1,085,250 ක් වශයෙන් හඳුනාගෙන තිබියදී, උසාවි දඩ ලෙජර් ගිණුමේ එය රු. 1,645,418 ක් ලෙස දැක්වීමෙන් ලැබිය යුතු ආදායම් රු. 560,168 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගනු ලැබූ රු. 59,800 ක වත්කම්, ස්ථාවර වත්කම් ගිණුමට හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට වැඩිපුර ගෙවා තිබූ එකතු කල අගය මත බදු රු. 879,758 ක් ලෙජර් ගිණුමෙහි වගකීම් ලෙස දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ද එය නිවරදි නොකර වගකීමක් ලෙස ලෙජර් ගිණුම තුල පෙන්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය කරන ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් 27868 ක් රු. 947,512 කට ණය පදනම මත අලෙවි කර තිබුණි. එම ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා නොමැති අතර, එහි නිෂ්පාදන වියදම රු. 560,105 ක්ද ගිණුම්ගත කර නොතිබුණි. තවද, ලැබිය යුතු ආදායම් රු. 947,512 ක්ද ලෙජර් ගිණුම මඟින් පෙන්වා නොතිබුණි.

(ඊ) 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වෙන්දේසි කිරීමට නිර්දේශ කරන ලද එකතුව රු. 83,897 ක් වටිනාකමැති භාණ්ඩ, නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට හා ස්ථාවර වත්කම් ගිණුමට ගැලපීම් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී රු. 15,174 ක්වූ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඒකක 70 ක් විනාශ කරන ලද නමුත් ලෙජර් ගිණුම් මඟින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 03 කට අදාලව පාලන ගිණුම අනුව ශේෂ එකතුව රු.16,919,372 ක් වූ අතර, උපයෝගී ලේඛණය අනුව එම ශේෂයන්ගේ එකතුව රු.9,811,780 ක් වූයෙන් රු.7,109,182 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

2010 නොවැම්බර් 16 දිනැති අංක 01/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ගිවිසුම් මත සේවකයින් තිදෙනෙකු බඳවාගෙන 2013 වර්ෂයේදී රු. 86,250 ක වැටුප් සහා අරමුදලින් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අයහාරය ඉක්මවූ පුනරාවර්ථන වියදම රු. 2,443,029 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අයහාරය ඉක්මවූ පුනරාවර්ථන වියදම රු. 298,489 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 718 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ආදායම වැඩිවීමේ වේගයට වඩා වැඩි වේගයකින් වියදම් වැඩිවීමත්, බලපත්‍ර ගාස්තු,දඩ හා වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් වල සිදුවී ඇති අඩුවීමත්ය ප්‍රධාන වශයෙන් බලපා තිබුනි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා සමුච්චිත හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 355 | 477 | 110 |
| බදු කුලී | 1,627 | 2,223 | 17 |
| බලපත්‍ර ගාස්තු | 472 | 369 | 42 |
| වෙනත් ආදායම් | 11,829 | 10,447 | 2,503 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී බලපත්‍ර ගාස්තු ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි සියයට 28 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2.3.3 වෙනත් ආදායම්

සභා බල ප්‍රදේශය තුල පාරිභෝගිකයන් 370 ක් පහසුකම් ලබන ජල ව්‍යාපෘති 11 ක් දැනට ක්‍රියාත්මක වන අතර, 2013 නොවැම්බර් 28 දින වන විට ඒවායේ නඩත්තු වියදම රු. 423,909 ක් විය. එදින දක්වා බිල්කල ආදායම රු. 180,332 ක් වූයෙන් නඩත්තු වියදමවත් පියවා ගැනීමට ප්‍රමාණවත් මුදලක් ජල පාරිභෝගිකයන්ගෙන් අයකර ගැනීමට නොහැකි වීමෙන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මස වනවිට රු. 243,577 ක අතිරේක පිරිවැයක් සභා අරමුදලින් දරා තිබුණි. තවද, 2012 වර්ෂයේ යථෝක්ත ව්‍යාපෘතිය මඟින් ජල සම්පාදනය ලබා දීම වෙනුවෙන් ජල පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ ජල ගාස්තු රු. 40,992 ක මුදලක් අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා හඳුනාගෙන ඇති රු. 1,398,690 ක මුද්දර ගාස්තු ආදායම ගෙන්වා ගැනීමටද එම වර්ෂයේ ඔක්තෝබර් මස සිට මුද්දර ගාස්තු ආදායම හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 අගෝස්තු මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා හඳුනාගෙන ඇති රු. 1,085,250 ක් වූ උසාවි දඩ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හියුම් පයිප්ප තොග ලේඛණය අනුව 2'x8 ප්‍රමාණයේ හියුම් පයිප්ප 09 ක් සහ 2'x4 ප්‍රමාණයෙන් හියුම් පයිප්ප 14 ක් සටහන් කර තිබුණද, 2013 දෙසැම්බර් 02 දින භෞතික පරීක්ෂාවේදී වටිනාකම රු. 22,998 ක් වූ 2'x8 ප්‍රමාණයේ හියුම් පයිප්ප 02 ක ඌනතාවයක් පැවතුණි.

(ආ) සභාව විසින් මිලදී ගනු ලබන හා භාවිතා කරනු ලබන පොදු ගබඩා තොග, පොදු ගබඩා ගිණුමක් මඟින් නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

අළුත්වැඩියා කලයුතු කෘෂකැබ් රථය, සිංගල් කැබ් රථය, මාර්ග තලනය, ස්වරාජ් ට්‍රැක්ටරය සහ කොන්ක්‍රීට් මිශ්‍රණය (කුඩා) අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂයක පමණ කාලයක් තිස්සේ අක්‍රීය තත්ත්වයේ පැවති අතර, චීන රජයේ ආධාර යටතේ ලැබී තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2012 පෙබරවාරි 07 දින සභාවට ප්‍රදානය කර ඇතත්, එකී යන්ත්‍රය විගණිත දිනය වූ 2013 නොවැම්බර් 28 දින වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණය මගින් කොන්ක්‍රීට් කුට්ටි ගල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ආදායම් හා වියදම් නිසි පරිදි ඇස්තමේන්තු කර අයවැය ලේඛණය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වැය ශීර්ෂ 25 කට අදාලව රු. 38,913,736 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, වැය ශීර්ෂ 09 කට සලසා තිබූ රු. 338,500 ක ප්‍රතිපාදන කිසිඳු වියදමක් නොදරා ඉතිරි වී තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) අයවැය පාලනය

(iii) ආදායම් පරිපාලනය